# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

### සහකාර අධ්‍යක්ෂ (පාලන) (MM 1-3) - 01

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රාජ්‍ය පරිපාලන / වාණිජ / කළමනාකරණ / නීතිය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ වෙනත් උපාධියක් සමග කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාළ තනතුරට අවශ්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : MM 1-1-3-2016 රු. 55,925 - 10 x 1,375- 15x1,910 - 98,325

**වයස් සීමාව** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර, අවු. 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ)

### අභ්‍යන්තර විගණක (JM 1-1)

ගණකාධිකාරී, කළමනාකරණ හෝ වාණිජ්‍යවේදී උපාධියක් හෝ රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම උපාධියක් සමග ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය විභාගය සමත්වීම.

සහ

අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
03. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සම්බන්ධයෙන් වන විට කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන (MA 2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : JM 1-1-2016 රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580

**වයස් සීමාව** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර, අවු. 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**පොදු කොන්දේසි :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.
- දැනට රජයේ සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් හට ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- අයදුම්පත් 2023.05.15 දිනට හෝ ඊට පෙර සහතිකවල සහතික කරන ලද පිටපත්ද සමගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- අභ්‍යන්තර අයදුම්කරුවන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

**සැ. යු.** ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීම් පටිපාටියේ විධි විධානවලට අනුකූලවයි.

**සභාපති,**
**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,**
**තැ.පෙ. 2211. ආනර් ද සිල්වා මාවත, කොළඹ 13.**